DOI: 10.31357/fhssphd.2008.00074

# උඩරට නැටුමේ විකාශනය සහ භාරතීය නර්තනය

අමුණුගම රාජපක්ෂ වෛද්‍යාලංකාර
රත්නාධිපති ගණිතගෙදර වෛද්‍යවති

දර්ශනසූරි 2006

# උඩරට නැටුමේ විකාශනය සහ භාරතීය නර්තනය

අමුණුගම රාජපක්ෂ වෛද්‍යලංකාර
රත්නාධිපති ගණිතගෙදර වෛද්‍යවති
ලේඛ්‍යාරූඪ අංකය - GS/HU /685/98

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන
අධ්‍යයනාංශයේ දර්ශනසූරි උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
නිබන්ධයයි

## අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම නිබන්ධයෙහි මා විසින් ඉදිරිපත් කරන ලද කරුණු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ උපදේශකත්වය යටතේ පවත්වාගෙන ආ අතර මෙම කෘතිය සම්පූර්ණ වශයෙන් වෙනත් විශ්ව විද්‍යාලයක හෝ ආයතනයක හෝ වෙනත් උපාධියක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

දිනය 07/08/2008

අයදුම්කරු

[signature]

ආර්. ඩබ්ලිව්. ජී. වෛද්‍යවතී

## උපදේශකගේ නිර්දේශය

අයදුම්කරු විසින් ඉහත සඳහන් කරන ලද ප්‍රකාශය සත්‍යය බවද ඇගයීම් සඳහා මෙම නිබන්ධය විශ්ව විද්‍යාලය වෙත ඉදිරිපත් කිරීමට සුදුසු බවද සහතික කරමි.

දිනය : 7/08/08

උපදේශක

මහාචාර්ය තිස්ස කාරියවසම්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
08 AUG 2008
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

# පටුන


| | පිටුව |
|---|---|
| අයදුම්කරුගේ ප්‍රකාශය | I |
| උපදේශකගේ නිර්දේශය | II |
| පටුන | III-VII |
| උපකාරනුස්මෘති | VIII-X |
| සාරාංශය | XI-XII |
| හැඳින්වීම | XIII-XV |
| පර්යේෂණ ක්‍රමවේදය | XVI-XXVI |
| සංක්ෂේපණ | XXVII-XXX |


## 01 පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 1. | **නර්තනය** | 1-4 |
| 1.1. | නර්තනයේ ප්‍රභවය | 4-10 |
| 1.2 | නර්තනය යන පදයෙහි අර්ථ ප්‍රකරණය | 4-10 |
| 1.3 | පංචවිධ චලන පද්ධති | 10-18 |
| 1.4 | උඩරට ප්‍රදේශයෙහි භෞතික පිහිටීම හා ඓතිහාසික තත්ත්වය | 18-22 |
| 1.5 | ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ස්වභාවය | 23-32 |
| 1.6 | ග්‍රාමීය මට්ටමේ ශාන්තිකර්ම | 33-37 |
| 1.7 | උඩරට නර්තන කලාව ප්‍රදේශීය වශයෙන් ව්‍යාප්ත වීමට පාදක වූ ආගමික සමාජීය පසුබිම් | 38-43 |
| 1.8 | උඩරට නර්තනන කලාව හා බැඳුණු සම්ප්‍රදයෙහි ස්වභාවය | 43-45 |
| 1.9 | නර්තන කලාව හැඳින්වීම සඳහා උඩරට යන පදය භාවිතයට බලපෑ ඓතිහාසික හේතු | |
| 1.10 | භාරතීය නර්තන කලාවේ සම්භවය හා වර්ධනය | 48-74 / 45-47 |
| 1.11 | භාරතීය නර්තන කලාව ශ්‍රී ලංකාවට ප්‍රවිෂ්ට වීම | 75-77 |
| 1.12 | භාරතීය නර්තනය බිහිවීමට තුඩු දුන් සමාජීය දේශපාලනමය හා ආගමික පසුබිම | 78-84 |

## 2 පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 2.1. | උඩරට නැටුම කෙරෙහි භාරතීය ආභාසය සහ උඩරට නැටුමේ වර්ධනය | 85-89 |
| 2.1.1 | මූලික හරඹ-බෙර වාදනය හා නර්තන පද රංග වස්තු හරඹ සහ වාද්‍ය ශිල්ප අතර ඇති භාරතීය සම්බන්ධය | 89-97 |
| 2..1.2 | ශාන්තිකර්ම නැටුම් පිළිබඳ වු වෙනස්කම් | 97-99 |
| 2.1.3 | වන්නම්, ප්‍රශස්ති වැනි නැටුම් පිළිබඳ වූ නව්‍ය ස්වභාවය | 99-101 |
| **2.2** | **රජමාලිගාව, දළඳ මාලිගාව හා වලව්ව තුළ වූ නර්තනයේ විකාශනය** | 101-106 |
| 2.2.1 | රජමාලිගාව සම්බන්ධ නර්තන කලාව | 107-108 |
| 2.2.2 | ප්‍රශස්ති නර්තන | 109 |
| 2.2.3 | හටන් කාව්‍යය හා බැඳුණු කඩු හා පළිහ නර්තනය | 109-110 |
| 2.2.4 | වන්නම් නර්තන | 110-111 |
| 2.2.5 | චාමර නැටුම | |
| 2.2.6 | අත් රබන් නර්තනය | 111 |
| 2.2.7 | සවරන් නර්තනය | 111-112 |
| **2.3** | **කවිකාර මඩුව හා සම්බන්ධ නර්තන කලාව** | 112-113 |
| 2.3.1 | පන්තේරු නර්තනය | 113-114 |
| 2.3.2 | උඩැක්කි නර්තනය | 114-115 |
| 2.3.3 | වන්නම් නර්තනය | 115 |
| 2.3.4 | ප්‍රභූ පන්තිය හා නර්තනය | 115-119 |
| **2.4.** | **දළඳ මාලිගාව හා සම්බන්ධ නර්තන කලාව** | 120-123 |
| 2.4.1 | අලුත් සහල් මංගල්ලය හා බැඳුණු නර්තන කලාව | 123-132 |
| 2.4.2 | කාර්තික මංගල්ලය හා බැඳුණු නර්තන කලාව | 132-135 |
| 2.4.3 | ඇසළ මංගල්ලය හා බැඳුණු නර්තන කලාව | 135-138 |
| 2.4.4 | උපසම්පදාව හා සම්බන්ධ නර්තන සම්ප්‍රදාය | 138-142 |


## 3 පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 3.1 | **කොහොඹා යක් කංකාරිය** | 143 |
| 3.1.1 | ශාන්තිකර්මය හැඳින්වීම සඳහා කොහොඹ / කොහොඹා සහ කංකාරිය යන පද එක්කොට ගැනීමට පාදක වූ පසුබිම | 143-144 |
| 3.1.2 | කොහොඹ යක් කංකාරිය ශාන්ති කර්මයෙහි පුද ලබා ගැනෙන දේව සංකල්පය | 145 |
| 3.1.3 | කොහොඹා යක් කංකාරිය හා බැඳුණු ඓතිහාසික කතා ප්‍රවෘත්තිය | 145-146 |
| 3.1.4 | කුවේණියගේ සාපයට පාදක වු කතා පුවත හා දිවිදෝෂය | 146-147 |
| 3.1.5 | මලය රජ ලක්දිවට ගෙන්වාගත් අයුර පිළිබඳ කතා පුවත | 147-151 |
| 3.1.6 | කොහොඹා යක් කංකාරිය සඳහා පූර්ව සූදානම | 151-166 |
| 3.1.7 | ශාන්තිකර්මය පවත්වන දවසේ පෙරවරු ජාමය හා බැඳුණු පූජා කර්ම | 166-170 |
| 3.1.8 | සවස් ජාමය හා බැඳුණු පුජා විධි රටාව | 170-180 |

| | | |
|---|---|---|
| 3.1.9 | මධ්‍යම රාත්‍රී ජාමය හා බැඳුණු පූජා විධි රටාව | 180-199 |
| 3.1.10 | අලුයම් ජාමය හා බැඳුණු පූජා විධි රටාව | 199-204 |
| 3.1.11 | ශාන්තිකර්මය පැවැත් වූ දවසට පසුදින පෙරවරුවේ ජාමයේ පැවැත්වෙන පූජා පෙළපාලි | 204-207 |
| 3.2 | **වලියකුම ශාන්තිකර්මය** | 208-210 |
| 3.2.1 | වලියක් දේව සංකල්පයෙහි උපත | 210-212 |
| 3.2.2 | වලියකුම ශාන්තිකර්මයේ ඓතිහාසික පසුබිම | 212-213 |
| 3.2.3 | වලියකුම පූර්ව සූදානම | 213-217 |
| 3.2.4 | වලියකුම පවත්වන ප්‍රථම දවසේ සිට හත්වැනි දවස අවසානය දක්වා වූ පෙළපාලි | 217-247 |
| 3.2.5 | ගරායක් පෙළපාලිය හා වලියකුමේ අවසාන පෙළපාලි | 247-255 |


## 4. පරිච්ඡේදය

| | | |
|---|---|---|
| 4 | **පත්තිනි දේවතාවිය හා සම්බන්ධ ශාන්තිකර්ම හා ජන නාටක** | 256 |
| 4.1 | **පඬුරු වෙන්කිරීම ශාන්තිකර්මය** | 256 |
| 4.1.1 | පඬුර / පඬුරු පද වල අර්ථ ප්‍රකරණය | 257-266 |
| 4.1.2 | පඬුර/පඬුරු යන පද භාවිතයේ ඓතිහාසික පසුබිම හා එහි ස්වභාවය | 266-270 |
| 4.1.3 | පඬුරු පද භාවිතයෙහි වර්තමාන ස්වරූපය | 270-272 |
| 4.1.4 | පඬුරු වෙන්කිරීම ශාන්තිකර්මය | 273-321 |
| 4.2 | **ගම්මඩු ශාන්තිකර්මය** | 322-329 |
| 4.2.1 | ගම්මඩුව ශාන්තිකර්මය පැවැත්වීමේ පරමාර්ථ | 329-332 |
| 4.2.2 | ගම්මඩු ශාන්තිකර්මයේ උපත් කතාව | 332-335 |
| 4.2.3 | ගම්මඩුව ශාන්තිකර්මයේ පුද ලබා ගැනෙන දේව සංකල්ප | 335-336 |
| 4.2.4 | පූර්ව සූදානම් හා පූජා පිළිවෙළ | 337-363 |
| 4.3 | **කිරි අම්මා පිදීම ශාන්තිකර්මය** | 364 |
| 4.3.1 | කිරි අම්මා පිදීම ශාන්තිකර්මයෙහි ප්‍රභවය | 364-365 |
| 4.3.2 | කිරි අම්මා දනය පැවැත්වීමේ අරමුණු | 365 |
| 4.3.3 | කිරි අම්මාවරුන් තෝරා ගැනීමේ ස්වභාවය | 366 |
| 4.3.4 | කිරි අම්මා දනයේ වත් පිළිවෙත් | 366-373 |
| 4.4 | **මුරුතැන් පිදීමේ පූජා කර්මය** | 374-377 |
| 4.4.1 | පූර්ව සූදානම | 377-392 |
| 4.5 | සොකරි නාටකය / නාඩගම හා බැඳුණු දේවදනය | 392 |
| 4.5.1 | සොකරි නාටකයෙහි ප්‍රභවය හා බැඳුණු උපත් කතාව | 393-394 |
| 4.5.2 | සොකරි නාටකය හා බැඳුණු දේව සංකල්පය | 394 |
| 4.5..3 | සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු | 395 |
| 4.5..4 | සොකරි නාටකය පැවැත්වීමේ කාලවකවානු | 395-396 |
| 4.5.5. | සොකරි නාටකය පැවැත්වීමේ ස්වභාවය | 396-397 |
| 4.5.6 | සොකරි නාටකයේ අනුපිළිවෙළ | 397-404 |

5 වැනි පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 5.1 | විත කර්ම හා යක්තොවිල් | 405-410 |
| 5..1.1 | කිලිමාලය / කිලිමාලෙ දීම | 411-412 |
| 5.1.2 | සීමා බන්ධන | 412 |
| 5.1.3. | භූත බලවේග බැඳීම | 412-413 |
| 5.1.4 | විවිධ කෙම් ක්‍රම | 413 |
| 5.1.5 | කටු ගැසීම | 413-414 |
| 5.1.6 | සතුරු දපන | 414 |
| 5.1.7 | දිවගුරු බැඳීම | 414-415 |
| 5.1.8 | විස බැඳීම | 415 |
| 5.1.9 | වස්කවි කීම | 415-421 |
| 5.1.10 | වශීකරණ | 421-425 |
| **5.2.** | **යක්තොවිල්** | 425-428 |
| 5.2.1 | යකුන් එළවීම හා යකුන් බැඳීම / බන්ධනය කිරීම | 428-436 |
| **5..3** | **හූනියම් / සූනියම් කැපීම ශාන්තිකර්මය** | 436-450 |
| **5.4** | **ප්‍රේතයින් එළවීම, ප්‍රේතයින් බැඳීම / බන්ධනය ශාන්තිකර්මය** | 450-459 |
| **5.5** | **බහිරව පූජා ශාන්තිකර්මය** | 459-475 |
| 5.6 | තීන්දු කැපීම | 475-478 |
| **5.7** | **කොටහළු යාගය** | 478-489 |
| **5..8** | **අභිමාන දෙවි / යක් පිදීම ශාන්තිකර්මය** | 490-493 |
| **5.9** | **රුක්පා යකුම ශාන්තිකර්මය** | 493-495 |
| **5.10** | **හත් අඩියේ දෙහි කැපීමේ ශාන්තිකර්මය** | 495-508 |
| **5.11** | **කඩවර කංකාරිය** | 509-543 |
| **5.12** | **බලියාගය/බලි ශාන්තිකර්මය** | 544-564 |
| 5.13 | අවශේෂ නර්තනාංග | 565 |
| 5.13.1 | ජනනැටුම් | 565-578 |
| 5.13.2 | ලී කෙළි සෙල්ලම / ලී කෙළි නැටුම | 578-581 |
| 5.13.3 | කළ ගෙඩි මාලේ නැටුම / කලගෙඩි නැටුම | 581-585 |
| 5.13.4 | තාලම් නැටුම | 585-587 |
| 5.13.5 | පතුරු වාදන නැටුම / පතුරු නැටුම | 587-588 |
| 5.13.6 | තේ දළු නෙළීමේ නැටුම/තේදළු නැටුම | 588-589 |
| 5.13.7 | දඬුබෙර වාදන නැටුම | 589 |
| 5.13.8 | වැදි ගෝත්‍රික නැටුම | 589-590 |
| 5.13.9 | වේවැල් නැටුම | 590 |

| | | |
|---|---|---|
| 5.13.10 | පත් තෙළීමේ නැටුම/පන්විලේ කථාව හා බැඳුණු නැටුම | 590-594 |
| 5.13.11 | ගොයම් කැපීමේ නැටුම | 594-595 |
| 5.13.12 | වී හාල් පෙළීම හා බැඳුණු කුළු නැටුම | 596 |
| 5.13.13 | මෝල් ගස් නැටුම | 597-598 |
| 5.13.14 | කුරක්කන් කැපීමේ නැටුම | 598-599 |
| 5.13.15 | මල් පිදීම හා බැඳුණු නැටුම/මල් නැටුම | 599 |
| 5.13.16 | ආලෝක පූජා නැටුම/පූජා නැටුම | 600-601 |
| 5.13.17 | බොරු කකුල් නැටුම | 601-602 |

**6. පරිච්ඡේදය**

| | | |
|---|---|---|
| 6.1 | උඩරට රාජධානියේ සමාජ ව්‍යුහය | 603-623 |
| 6.2 | උඩරට ප්‍රදේශයේ ආගමික හා සමාජ සංස්ථා | 624-630 |
| 6.3 | උඩරට රාජධානියේ කුලධූරාවලිය | 630-637 |
| | සමාලෝචනය හා නිගමනය | 638-640 |
| | ආශ්‍රිත ග්‍රන්ථාවලිය / සිංහල - ඉංග්‍රීසි | 641-657 |
| | උපග්‍රන්ථය/ඡායාරූප එලක/සිතියම්/වගු | 658-691 |
| | සූචිය | 692-703 |

# උපකාරනුස්මෘති

රජයේ නැටුම් හා මුද්‍රානාට්‍ය විද්‍යාලය 1974 වර්ෂයේ ලංකාවිශ්ව විද්‍යාලයට අනුබද්ධ කිරීමෙන් පසු එවකට සිටි පැරණි ආචාර්ය වරුන්ට පර්යේෂණාත්මක අධ්‍යයනයන් කිරීමේ වැදගත්කම මෙන් ම එම කාර්යයන් ඉටු කළ යුතු ආකාරය හඳුන්වා දෙනු ලැබුවේ වසර දහයකට ආසන්න කාලයක් සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ (වර්තමාන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය) අධ්‍යක්ෂව සිටි එවකට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශ ප්‍රධානව සිටි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් මැතිතුමා විසිනි.

පර්යේෂණ කාර්යය වටහා දෙමින් ද විශ්ව විද්‍යාල ක්ෂේත්‍රය තුළ පර්යේෂණය කිරීමේ වැදගත්කම පෙන්වාදෙමින් ද ලබාදුන් උපදෙස් මගින් පර්යේෂණ කාර්යයන් කිරීමට මා සිත තුළ දැඩි ආශාවක් ඇති විය. අප වැනි දුහුනන් ද ශාස්ත්‍රීය පර්යේෂණ කටයුතු වල නිරත වනු දැක්ම තම දිවියෙහි එකම අරමුණ කරගත් ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් මැතිතුමාගේ මගපෙන්වීම උඩරට නැටුමේ විකාශනය සහ භාරතීය නර්තනය යන මාතෘකාව යටතේ පර්යේෂණය කිරීමට මා තුළ බලවත් ආශාවක් ඇති කිරීමට සමත් විය.

මෙම අධ්‍යයන කාර්යය සම්බන්ධව මාගේ උපදේශකවරයාණන් ලෙස ක්‍රියාකරමින් ද උපදෙස් ලබා දෙමින් ද තම වටිනා කාලය කැප කරමින් පර්යේෂණ කාර්යය කල යුතු ආකාරය පිළිබඳ සියළු කරුණු එකිනෙක හඳුනාදෙමින් සදෙස් තැන් නිදොස් කිරීම ආදියෙන් ද මා කරන ලද වැරදි සත්භාවයෙන් යුතුව ඉවසමින් ද මා වෙනුවෙන් කාලය කැප කොට අවංක හදවතින් යුතුව මට උපකාර කළේය. එසේ වූ මාගේ ගුරු දේවයාණන්ට මාගේ ගෞරවණීය භක්තිප්‍රණාම ස්තුතිය කෘතවේදීව දෙපානැමැද පුද කර සිටිමි.

මෙම පර්යේෂණ කාර්යයේදී නොමඳ දිරියක් මා හට ලබාදෙමින් නන් අයුරින් උපකාර කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ හිටපු අංශාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න ගුරු පියාණන්ටද මා දිරිමත් කරමින් නොමඳ සහාය ලබා දුන් වර්තමාන අංශාධිපති මහාචාර්ය ධම්මික ගංගානාත් දිසානායක ගුරු පියාණන්ට ද මාගේ කෘතවේදී ස්තුතිය පුද කරන්නේ ගුරු බැතියෙනි.

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය කිවුලේ ගෙදර නාරද ස්වාමින්වහන්සේ ද ගෞරවයෙන් සිහිපත් කරමි. මා හට නිරතුරුවම උපකාර කරන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුසුමලතා ලංකාමුල්ල මහත්මියට ද මාගේ ස්තුතිය හිමිවේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහත්මාණන් ද මෙම අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය යසාංජලි දේවිකා පෙරේරා මහත්මිය ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ජයන්ත ජයසිරි මහත්මා ද ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදය කුමාර අමරසිංහ මහත්මාණන් ද මහාචාර්ය බී. ඒ. ටෙනිසන් පෙරේරා මහත්මාණන් ට ද මාගේ ස්තුතිය හිමි වේ.

පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය පූජ්‍ය මාවතගම පේමානන් ද ස්වාමීන් වහන්සේට ද අපගේ කෘතඥතාව හිමි වේ. භාෂා හා සංස්කෘත අධ්‍යයනාංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ මහත්මාණන් ද, එම අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝරි මනම්පේරි මහත්මියට ද ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංජීවි මන්ත්‍රිරත්න මහත්මිය ද මාගේ ස්තුතිය හිමි වේ.

පර්යේෂණ කාර්යය කරගෙන යෑම සඳහා අධ්‍යයන නිවාඩුව ලබා ගැනීම සඳහා උපකාර කළ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උඩරට නර්තන අධ්‍යයනාංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධනපාල ඕවිටගෙදර මහත්මාණන් ට ද මාගේ ස්තුතිය හිමිවේ. දහසකුත් කටයුතු ඉවත දමා තමාගේ වටිනා කාලය මා වෙනුවෙන් කැප කරමින් උපකාර රාශියක් කරදුන් නාට්‍යකලා මුද්‍රා නාට්‍ය හා නූතන නර්තන අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ලයනල් බෙන්තරගේ මහත්මාණන්ට මාගේ කෘතවේදිත්වය හිමි වේ. තත් අයුරින් උපකාර කළ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්මිකා ලංකාතිලක මෙනෙවියට ද කථිකාචාර්ය සුමතිපාල ශිල්පාධිපති මහත්මාණන්ට ද කථිකාචාර්ය තිලක වීරසිංහ මහත්මාණන්ට ද කථිකාචාර්ය මහින්ද කුමාර විමලසිරි මහත්මාණන්ට ද මාගේ ස්තුතිය හිමිවේ. සෞන්දර්ය කලා විශේෂ විද්‍යාලයේ මානව සංගීත අධ්‍යනාංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රංජිත් ප්‍රනාන්දු මහත්මාණන්ට ද මාදිරි ගැන් වූ කැලණිය විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහත්මාණන් ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුරාධා සෙනෙවිරත්න මහත්මාණන් ද මාගේ ගෞරවයට පාත්‍ර වේ.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ මහාචාර්ය පූජ්‍යපාද වරකාවේ ධම්මාලෝක ස්වාමීන් වහන්සේ ද බුහුමන් පෙරදැරිව කෘතවේදිව සිහිපත් කරමි. මා දිරිගන්වමින් එම විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ ජෙෂ්ඨ මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න මහත්මාණන්ට ද මාගේ ස්තුතිය හිමිවේ.

මාගේ පර්යේෂණ කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා මා හට උපකාර කළ සීතා කාරියවසම් මහත්මියට ද මාගේ කෘතවේදී ස්තුතිය පුද කරමි.

මා හට කවදත් උපකාර කරන නීලමනී පුෂ්ප කුමාරි දිසානායක මහත්මියට ද මාගේ ස්තුතිය හිමිවේ.

ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු වල දී අවශ්‍ය දත්ත එක්රැස් කොට දුන් සියලුම විද්වතුන් පිරිසට ද මාතලේ, මහනුවර, කෑගල්ල සහ කුරුණෑගල යන ප්‍රදේශගතව සිටින පාරම්පරික ශාන්තිකර්ම ඇදුරුතුමන්ලාට ද දළදා මාලිගාවේ ඇතුල් කට්ටලේ හා පිට කට්ටලේ කාර්ය පිරිසට ද සතර දේවාලයේ හා රජමහා දේවාලවල කාර්ය පිරිසට ද පහතරට ශාන්තිකර්ම පිළිබඳ කටයුතු කරන ජ්ඩින් වීරසිංහ මහතා ඇන්. ඇන්. සේදරමන් මහතා රංජිත් රත්නසිරි මහතා ආදීහු සියලු දෙනා ද මාගේ ස්තුතිය ලබන්නාහු වෙත්.

පර්යේෂණ කාර්යය සඳහා අදාළ ශබ්ද කෝෂ සපයා දෙමින් නන් අයුරින් උපකාර කළ ශබ්ද කෝෂ කාර්යාලයේ පණ්ඩිත ආචාර්ය කේ. බී. ඒ. එඩ්මන්ඩ් මහත්මා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනා ද ජාතික කෞතුකාගාර පුස්තකාලයේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනා ද ජාතික පුස්තකාල සේවාමණ්ඩලයේ සියලු දෙනාට ද සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ද ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පුස්තකාලයේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ද මාගේ ස්තුතිය හිමි වේ.

ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතුවල දී මා පසු පස හෙවනැල්ල සේ පැමිණි අමාලි උදේශිකා රාජපක්ෂ, අරුණි සමුද්‍රිකා රාජපක්ෂ, දිලිනි චතුරිකා කාවිශ්වර යන ආදි දියණිවරුන් ද ජනක ප්‍රශාන්ත රාජපක්ෂ, අනුර නිශාන්ත රාජපක්ෂ, නදිර ප්‍රසන්න කවිශ්වර, සුදේශ් රුක්ෂාන් රාජපක්ෂ යන පුතාලා ද ආදරයෙන් සිහිපත් කරමි.

මාගේ මවගේ අභාවයෙන් පසු මට මවක් මෙන් නිතර සලකමින් ගෙදරදෙරේ වැඩ කටයුතු කරමින් මාගේ පර්යේෂණ කටයුතු නිහඬව කරගෙන යෑමට මට ශක්තිය ධෛර්යය ලබා දුන් අතෝද්‍යා රාජපක්ෂ සහ අයිරාංගනී රාජපක්ෂ නැගණියන්ට ද මාගේ ස්තුතිය හිමි වේ.

දහසකුත් කරදර සහ වෙහෙස මහන්සිය නොබලා නිබන්ධයේ අවසාන පරිගණක අක්ෂර සංයෝජනය කටයුතු කරදුන් කළුතර චින්තක ටයිප් සෙටින්හි අධිපති ජේ. මහින්ද මහත්මාට සහ ඉන්ද්‍රානි ගුණතිලක මහත්මියට ද මාගේ කෘතවේදී ස්තුතිය පුද කර සිටිමි. දර්ශනීය ලෙස පොත බැඳදුන් චම්මිකා බුක් බයින්ඩින් අධිපතිතුමාට ද මාගේ ස්තුතිය හිමිවේ.

## සාරාංශය

උඩරට නර්තන කලාවෙහි අන්තර්ගත නර්තන අවස්ථා, යකුන් දෙවිවරුන් සහ නවග්‍රහයින් මුල් කොට ගෙන පැවැත්වෙන විවිධ ශාන්තිකර්ම අවස්ථා හා බැඳී පවතී. ප්‍රාථමික මානව සමාජ ඔවුන්ගේ ලෙඩ රෝගාදියත්, කෘෂි වගාවන්ට සහ ඇති කරගත් සතුන්ට වැළඳෙන්නාවූ ලෙඩ රෝගාදියත්, සුවකර ගැනීමේ චිකිත්සාවක් හැටියට පමණක් නර්තනය උපයෝගී කොට ගැනිණි. ශාන්තිකර්ම පැවැත් වූ පිරිස යක් ඇදුරු (යකැදුරු) බලි ඇදුරු බලිතියන, ගී කියන/කවි දක්වන්නන්, යක්දෙස්සන්, කපුපත්තිනි රාළවරුන් ආදී වශයෙන් නාමිකව හැඳින්විණි. මේ පිරිස ශිල්පශ්‍රේණි වශයෙන් විකාශනය විය. ශාන්තිකර්ම විෂය-ක්ෂේත්‍රය හා යන්ත්‍ර, මන්ත්‍ර, තන්ත්‍රාදිය හා නක්ෂත්‍රය, අටමඟල විධි, චිත්‍රකරණයන්, මූර්ති සහ කැටයම් සහ ස්වාභාවික වෘක්ෂලතාදියෙන් - නිමවා ගැනෙන සැරසිලි ක්‍රම ද අන්තර්ගතව පවතී. ශාන්තිකර්ම හා බැඳුණු ඇදුරු පරම්පරා ග්‍රාමීය සමාජවල ජීවත් වූ ආකාරයත් ශිල්ප ශාස්ත්‍රාදිය පවත්වා ගෙන ගිය ආකාරයත් උඩරට රාජධානියේ විසූ රජවරුන්ගේ නියෝග මත සිදු වී ඇති බව පෙනේ.

බුදු දහම විකාශනය වීම මගින් බෞද්ධ සංස්කෘතියට අදළ වන පරිදි නර්තන කලාවක සම්භවය සිදු වූ අතර එකී නර්තන වාර්ෂිකව ඉටු කෙරෙන තේවා වත් පිළිවෙත් හා සම්බන්ධ කොට ගැනුණි. බෞද්ධ සංස්කෘතිය හා බැඳුණු නර්තන කලාව සහ රෝගෝපසමණය කර ගැනීම සඳහා සම්භවය ලැබූ නර්තන කලාව අතර වෙනස් ස්වරූප දිස්විය. මෙකී නර්තන කලා විෂයක්ෂේත්‍රයයන් පවත්වා ගෙන යෑම සඳහා වෙන් වූ පිරිස් ද වූහ. බෞද්ධාගමික නර්තන ඉදිරිපත් කිරීමේ දී දළදා මාලිගාවේ තේවා කාරක පිරිස, ඇතුල් කට්ටලේ සහ පිට කට්ටලේ යනුවෙන් කොටස් දෙකකින් යුතුව විද්‍යමාන වේ. මෙහි කුලධුරාවලියක් ද පවතී. උඩරට රජවරුන්ගේ නියෝගමත එකී කුලධුරාවලිය හා බැඳුණු පිරිස් හා බැඳි පැවැති නර්තන, හේවිවාදන හා ගායන කටයුතු වර්තමානයේ ද දළදා මාලිගාව ඇතුළු සතර දේවාලවල දෛනික හා වාර්ෂික චාරිත්‍ර වශයෙන් පවත්වා ගෙන යන බව පෙනේ.

උඩරට රාජධානියේ විසූ රජවරුන්ගේ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු හා රාජ සභාව, කවිකාර මඩුව හා බැඳුණු නර්තන හා හේවිවදන කලාවක් ද එකී අවශ්‍යතා අනුව ඇතුල් කට්ටලේ හා පිට කට්ටලේ ශිල්පශ්‍රේණි පිරිස නිර්මාණය කර ගත්හ. රජ මැඳුරුවල ද රජතුමා හා රජපවුල් උදෙසා ද නර්තනාංග හා හේවිවාදනාංග නිර්මාණය කොට ඉදිරිපත් කිරීම නිසා ඒ හා බැඳුණු නර්තන කලාවක් ද නිර්මාණය විය. ඒවා රාජකීය උත්සව සඳහා පමණක් අදළ

කොට ගැනිණ. රජවරුන් ගේ රාජ්‍ය පරිපාලන කටයුතු සඳහා සහාය වූ පිරිස රදළ පවුල්වලට අයත් වූහ. රදළයන් සඳහා ද නැටුම් කණ්ඩායම් සිටියහ. මේ පිරිස ඒ සඳහා ද වෙන් වූ නර්තන හා හේරිවාදන සම්ප්‍රදයයන් නිර්මාණය කර ගත්හ.

මේ තත්ත්වය අනුව උඩරට රාජධානි සමයෙහි වැඩවසම් සමාජ රටාවක්ද ස්ථාපිත විය. මහනුවර යුගයේ වැඩ වසම් සමාජය ක්‍රමය අනුව රාජ්‍ය තාන්ත්‍රික කාර්යයන් උසස් මට්ටමකින් පවත්වා ගෙන ගිය අතර දළදා මාලිගාවේ මෙම පිළිවෙත වර්තමානයේ ද පවතියි. උඩරට රාජධානියේ පැවැති සමාජ ස්තරායනය දළදා පෙරහැර මගින්ද, දළදා මාලිගාව ශ්‍රී මහා බෝධිය හා සතර දේවාල මගින් ද, ආරක්ෂා වී ඇත්තේ බෞද්ධාගමික තේවා පිළිවෙත් මුල් කොට ගෙනය. එමගින් උඩරට නර්තන කලාවේ ගතික ස්වරූපය ද, නායක්කර් රජවරුන්ගේ පාලන තාන්ත්‍රික කටයුතු මගින් විකාශනය වූ හින්දු ආගමික ලක්ෂණ ද වර්තමානයේ ද පවතියි.

නායක්කර් රජවරුන් නිසා භාරතීය සංගීතය හා බැඳුණු තූර්ය වාදනය හා නර්තන කලාවක් ද උඩරට යන පදයෙන් හැඳින්වූ නර්තන කලාවට එක්වුණු අතර භාරතීය කලා ශිල්ප මගින් උඩරට නැටුම් කලාවේ පෝෂණය ද ඇති විය. භාරතීය හා ශ්‍රී ලාංකේය රජවරුන් අතර පැවැති මිත්‍රත්වය හේරිවාදනය, නර්තනය, රංගවස්ත්‍රාභරණ හා ඒ හා බැඳුණු චිත්‍ර මූර්ති ආදී කලාවන්ගේ ද පෝෂණය ට ඉවහල් විය. උඩරට නර්තන කලාවේ වැඩි වශයෙන් දකුණු ඉන්දියානු ආභාසය අන්තර්ගතය.

බෞද්ධාගම මුල් කොට ගෙන ද නායක්කර් රජ පෙළපත් මගින් ද, උඩරට රාජධානියේ පැවැති පාලන තන්ත්‍රය මගින් බිහි වූ වැඩවසම් සමාජ ස්තරායණය මගින් ද, උඩරට නර්තන කලාවේ ගතික ස්වභාවය, නවතාව, පෝෂණය වර්ධනය, උපයෝගීතාව හා ආගමික රාජ්‍යතාන්ත්‍රික සමාජීය සහ සංස්කෘතිකමය ස්වභාවයන් ද හඳුනාදීම මෙම අධ්‍යයන කාර්යය මගින් ඉටු කෙරේ.

එ බැවින් මේ පර්යේෂණ කාර්යයේ මූලික වන්නේ උඩරට රාජධානියේ පැවැති වැඩවසම් ක්‍රමය හා බැඳුණු නර්තන හා හේරිවාදන කලාව හා ඒවා පවත්වාගෙන ආ ස්වභාව අනාගත පරපුරකට එක්රැස් කොට තැබීමය. එහි ඇති සමාජ සංස්කෘතිය ආගමික සම්බන්ධතාව භාරතය හා ශ්‍රී ලංකාව අතර පැවැති මිත්‍රත්වය හඳුනාදීම ද අනාගත පරපුරකට වැදගත් වේ. එමගින් නර්තන කලාවේ ගතිකත්වය ද පෝෂණය ද නවතාවයද ආගමික සම්බන්ධතාවයද ලෝක උරුමයන් වශයෙන් හඳුනා ගැනීමට වැදගත් වන බව හඳුනා දීමද මෙකී පර්යේෂණ කාර්යයේ අපේක්ෂාව වේ.

# හැඳින්වීම

විධිමත් නර්තන කලාව ප්‍රාග්බෞද්ධ සමාජවල පැවති ඇදහිලි හා විශ්වාස මුල්කොට ගෙන බිහි වූ අභිචාර විධි (Magic) පාදක කොට ගෙන ප්‍රභවය ලබා ඇත. මෙකී යුගයේ නර්තන කලාව බැඳී පැවතුනේ රෝගෝපසමනය කර ගැනීම සඳහා මහා සම්ප්‍රදායානුකූලව බිහි වූ යාතු කර්ම (Ritual) හෙවත් ශාන්තිකර්ම අවස්ථා සඳහා පමණි. ශ්‍රී මහා බෝධිය හා දළදා ව ප්‍රධානකොට ගෙන ඉටු කෙරෙන තේවා වත් පිළිවෙත් හා සම්බන්ධ කෙරෙන නර්නත කලාවක් ද බොදු සංස්කෘතිය පාදක කොට ගෙන බිහිවිය. සමාජීය වශයෙන් ඉදිපත් කෙරෙන නර්තන කලාවක් ද උඩරට රාජධානි සමයෙහි ගොඩ නැංවිණි. වර්තමානයේ උඩරට යන පදයෙන් හැඳින්වෙන නර්තන කලාව උඩරට පහත රට සබරගමුව ඌව සහ නුවර කලාවිය ආදී ප්‍රදේශ ගතව භාවිතයේ පවතී.

නර්තන ගුරු කුල පරම්පරා අතර දිස්වෙන උඩරට නර්තන කලාව ඉපැරණි ස්වරූපයට අනුව ශාන්තිකර්ම අවස්ථා සහ බෞද්ධාගමික වශයෙන් ඉදිරිපත් කෙරේ. එකී නර්තන ස්වරූපයන් අතර වෙනස් කම් පවතී. උඩරට රාජධානි සමයෙහි මෙන් ම වර්තමානයේ ද ශ්‍රී මහා බෝධිය සහ දළදා ව මුල් කොට ගෙන පැවැත්වෙන නර්තන කලාව සඳහා රාජ අනුග්‍රහය දැඩිව පවතී. උඩරට නර්තන කලාවේ ශාන්තිකර්ම අවස්ථා හා බැඳී පවතින නර්තන අවස්ථා සහ බොදු සංස්කෘතිය හා බැඳී පවතින නර්තන අවස්ථා සම්බන්ධ විෂයක්ෂේත්‍රය, බුදුන් වහන්සේ ප්‍රමුඛ දේව සංකල්පය හා බැඳී පවතින තේවා වත් පිළිවෙත් වලදී පූජා අර්ථ කොට ගෙන උපයෝගී කොට ගැනීම ජනප්‍රියත්වයට පත්ව ඇත. දළදා මාළිගාව, කවිකාර මඩුව, ඇසළ මංගල්ලය, වලියක් මංගල්ලය ප්‍රධාන කොට ගෙන නර්තන හේවිවාදන ගායනාදිය බැඳි පවතින ශිල්ප ශ්‍රේණි ප්‍රධානකොට ගෙන උඩරට නර්තන විෂයක්ෂේත්‍රය ආගමික වශයෙන් විකාශනය විය.

භාරතීය නර්තන කලාවද උඩරට සම්ප්‍රදයයේ නර්තන අවස්ථා පෝෂණයෙහි ලා ඉවහල් වී ඇත. රාජධානි සමයෙහි මෙන්ම වර්තමානයේ ද බෞද්ධාගාමික රාජතාන්ත්‍රික සමාජයීය හා සංස්කෘතික වශයෙන් භාරතීය නර්තන හා ලාංකේය නර්තන ඉදිරිපත් කෙරේ. භාරතීය නර්තන කලාවේ අභාසය උඩරට නර්තන කලාවේ අභිවෘද්ධිය සඳහා ඉවහල් විය. මහනුවර, මාතලේ, සතරකෝරළය හෙවත් කෑගල්ල, සත්කෝරළය හෙවත් කුරුණෑගල යන ප්‍රදේශගතව උඩරට රාජධානි සමයේ උඩරට යන පදයෙන් හැඳින් වූ